සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 33 - ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

CamScanner

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

තායිලන්තය :- සියම
මියන්මාරය :- බුරුමය
රාමඤ්ඤ දේශය

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

## 33 - ඉතිහාසය

**I පත්‍රය - ලකුණු 1 x 40 = ලකුණු 40**

---

**II පත්‍රය -**

**I කොටස**

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) කොටස | - | ලකුණු | 18 | ලකුණු 30 | ලකුණු 120 |
| (ආ) කොටස | - | ලකුණු | 12 | | |

**II කොටස**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 4කට) 4 x 18 = ලකුණු 72 |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 18 | |

**III කොටස**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 8 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 1කට) 1 x 18 = ලකුණු 18 |
| ප්‍රශ්න අංක 9 | - | ලකුණු | 18 | |

**අවසාන ලකුණු ගණනය කිරීම**

* සමස්ත පිළිතුරු පත්‍රයේ අවසන් ලකුණ මණ්ඩලය තුළ දී ගණනය කිරීම සිදු නොකෙරේ.

**ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කළ යුතු ආකාරය.**

I පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 2 කින් ඇතුළත් කළ යුතුය.

II පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 3 කින් ඇතළත් කළ යුතුය.



CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ............................................... | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ............................................... | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ............................................... | √ | △ $\frac{3}{5}$ |
| (03) | එකතුව | → | □ $\frac{10}{15}$ |

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***



CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



# I පත්‍රය - ඉගෙනුම් පල

- ඉතිහාසය 10 සහ 11 ශ්‍රේණිවලට අදාල විෂය නිර්දේශවල ඇතුලත් ඉගෙනුම් පල ආවරණය වන පරිදි ඓතිහාසික සිද්ධීන් හා සංකල්ප පිළිබඳ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණ, සංස්ලේෂණ හැකියා පිරික්සීම



CamScanner

OL/2024(2025)/33/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**33 | S | I**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

| | |
|---|---|
| ඉතිහාසය I<br>வரலாறு I<br>History I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>*One hour* |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අතීත ශ්‍රී ලංකාවේ වෙළෙඳාම හා ලෝහ කර්මාන්තය පිළිබඳ හැදෑරීමේ දී වැදගත් මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?
(1) අභිලේඛන (2) නටබුන් (3) ස්මාරක (4) කාසි

**2.** මෙරට බ්‍රාහ්මීය සෙල්ලිපිවල බහුලව සඳහන් වන තොරතුර වන්නේ මින් කුමක් ද?
(1) භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම (2) රජයේ නීති මහජනයාට දැන්වීම
(3) බදු අය කිරීම (4) විහාර ආරාම පරිපාලනය

**3.** ප්‍රාග් ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිබඳ දැනගැනීමට ඇති එකම සාධකය වන්නේ,
(1) සුසාන භූමි ය. (2) නිවාස ය. (3) ගල් මෙවලම් ය. (4) මැටි වළං ය.

**4.** මුල් යුගයේ ජනතාව ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශ පදිංචිය සඳහා තෝරා ගැනීමට හේතුව කුමක් ද?
(1) ගංවතුර උවදුරෙන් බේරීම (2) කෘෂිකර්මාන්තයට හිතකර සාධක පැවතීම
(3) වන සතුන්ගෙන් ආරක්ෂා වීම (4) ගමනාගමන පහසුව

● A, B, C හා D යන ප්‍රකාශ ඇසුරෙන් පහත 5 සහ 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A – වැව් කේන්ද්‍ර කරගනිමින් ජනාවාස බිහිවීම
B – ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම
C – විවිධ වෘත්තීන්ට අනුව ජනාවාස බිහිවීම
D – කෘෂිකාර්මික කටයුතු ආරම්භ වීම

**5.** පූර්ව ඓතිහාසික යුගය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

**6.** මුල් ඓතිහාසික යුගය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

**7.** ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් බෙල්ලන් වර්ග සුලභව දක්නට ලැබෙන පරිසර කලාපය කුමක් ද?
(1) පහතරට වියළි කලාපය (2) පහතරට තෙත් කලාපය
(3) ශුෂ්ක කලාපය (4) කඳුකර වියළි කලාපය

**8.** **I තීරුවේ** සඳහන් කාර්ය හා සම්බන්ධ රජවරුන්ගේ නම **II තීරුවේ** දැක්වේ. **I තීරුව** සමග **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සීගිරිය බලකොටුව ඉදිකිරීම | A – දේවානම්පිය තිස්ස |
| 2. පරුමකවරුන් රජයේ ඉහළ තනතුරුවලට පත් කිරීම | B – වළගම්බා |
| 3. ශ්‍රී මහා බෝධි ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම | C – පළමුවන කාශ්‍යප |
| | D – දුටුගැමුණු |

(1) A, B, C (2) C, B, D (3) C, D, A (4) D, A, B



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

9. වසභ, මහසෙන් හා මහා පරාක්‍රමබාහු යන රජවරුන් පිළිබඳ පොදු කරුණ වන්නේ මින් කුමක් ද?
   (1) රට එක්සේසත් කිරීම
   (2) විදේශ ආක්‍රමණවලින් රට බේරාගැනීම
   (3) විශාල වෙහෙර විහාර ඉදිකිරීම
   (4) වාරි කර්මාන්තයේ දියුණුවට කටයුතු කිරීම

10. රටක දේශපාලන බලය මධ්‍යගත වූ විට,
   (1) එක්සත් රාජ්‍යයක් බිහි වේ.
   (2) රටේ බෙදීමක් ඇති වේ.
   (3) විදේශ රාජ්‍යයකට යටත් වේ.
   (4) යටත්විජිතයන් හිමි වේ.

11. අනුරාධපුර රාජධානි සමයේ මෙරට වෙළෙඳ කටයුතුවල නිරත වූ බොහෝමයක් වෙළෙඳ සංවිධාන අයත් වූයේ,
   (1) උතුරු ඉන්දියානුවන්ට ය.
   (2) දකුණු ඉන්දියානුවන්ට ය.
   (3) චීන ජාතිකයන්ට ය.
   (4) පර්සියානු ජාතිකයින්ට ය.

12. 'වෙජ්ජසාලා' යනු කුමක් ද?
   (1) ආරෝග්‍යශාලා
   (2) හින්දු ආගමික මධ්‍යස්ථාන
   (3) නාට්‍යශාලා
   (4) අධ්‍යාපන මධ්‍යස්ථාන

13. මහවැලි ගඟේ අතු ගංගාව කුමක් ද?
   (1) මැණික් ගඟ
   (2) අඹන් ගඟ
   (3) දැදුරු ඔය
   (4) කලා ඔය

- පහත A, B, C හා D යන ප්‍රකාශ ඇසුරෙන් **14** හා **15** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   A – පොළවට ලම්බාකාර බිත්ති බැඳීම
   B – පදම් කළ මැටි භාවිත කිරීම
   C – සුසාන ගර්භයට මැටි තළ සවි කිරීම
   D – මැටි බඳුනට දහයියා පුරවා පිළිස්සීම

14. අතීතයේ නිවාස තැනීමේ තාක්ෂණය දැන සිටි බව තහවුරු කෙරෙන ප්‍රකාශය කුමක් ද?
   (1) A
   (2) B
   (3) C
   (4) D

15. අතීතයේ දහනය සඳහා වායුව අවශ්‍ය යැයි දැන සිටි බව තහවුරු කෙරෙන ප්‍රකාශය කුමක් ද?
   (1) A
   (2) B
   (3) C
   (4) D

16. අතීතයේ මැනීම සඳහා යොදාගත් මිනුම් ඒකක **I තීරුවේ** ද මැනීම සිදු කළ දෑ **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** හා **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අමුණ | A – කාලය |
| 2. වියත | B – භූමිය (අවකාශය) |
| 3. තත | C – දිග |
| | D – බර |

   (1) A, B, C
   (2) B, C, A
   (3) C, B, D
   (4) D, A, B

17. සිගිරි ජලමල්වල ජල කඳේ උස වෙනස් කිරීමට අතීත නිර්මාණ ශිල්පීන් යොදාගත් උපක්‍රමය වූයේ,
   (1) ගල් පතුරේ සිදුරුවල විෂ්කම්භය සමානව නිර්මාණය කිරීම ය.
   (2) ගල් පතුරේ සිදුරුවල විෂ්කම්භය වෙනස්ව නිර්මාණය කිරීම ය.
   (3) සිදුරු සහිත ගල් පතුරේ ඝනකම වැඩි කිරීම ය.
   (4) සිදුරු සහිත ගල් පතුරේ ඝනකම අඩු කිරීම ය.

18. අතීතයේ ශ්‍රී ලංකාව හා පැවැති විදේශ වෙළෙඳ ගනුදෙනුවල දී භාවිත කළ කාසි පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) සෑම කාසියක්ම එකම ලෝහයකින් සාදා තිබීම
   (2) සෑම කාසියක්ම සමාන බරකින් යුතු වීම
   (3) ඕනෑම රටකට අයත් කාසි වෙළෙඳ ගනුදෙනු සඳහා භාවිත කිරීම
   (4) ජාත්‍යන්තරව පිළිගත් පොදු කාසි වර්ගයක් ගනුදෙනු සඳහා භාවිත කිරීම

19. හේන් වගා කිරීම වෙනුවෙන් රජයට අය කරගත් බද්ද හැඳින්වූයේ මින් කුමන නමකින් ද?
   (1) මහරමජ්ඣක
   (2) කැති අඩ
   (3) දකපති
   (4) බොජකපති

20. අතීතයේ දී ආහාරය සඳහා බහුලවම භාවිත වූ ධාන්‍ය වර්ගයක් වන්නේ මින් කුමක් ද?
   (1) තිරිඟු
   (2) වී
   (3) බාර්ලි
   (4) කවිපි



CS CamScanner

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් **21** ප්‍රශ්නය සඳහා පිළිතුරු ලියන්න.

A – මෙරට අවසාන රාජධානිය වීම
B – ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අවසාන පාලකයා වීම

**21.** මහනුවර රාජධානිය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ.
(2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(3) A හා B අසත්‍ය වේ.
(4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**22.** පෘතුගීසින්, ලන්දේසින් හා ඉංග්‍රීසින් සම්බන්ධතා පැවැත්වූ රාජධානිය කුමක් ද?
(1) සීතාවක (2) රයිගම (3) කෝට්ටේ (4) මහනුවර

**23.** පෘතුගීසීන් හා යාපනේ පාලකයන් අතර නිරතුරුව ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑ ප්‍රධානතම හේතුව වූයේ,
(1) පහතරට සිංහල පාලකයන්ගේ පෘතුගීසි විරෝධී සටන්වලට යාපනේ පාලකයන් සහාය දැක්වීමයි.
(2) මන්නාරම් මුහුදේ මුතු කිමිදීමේ කටයුතුවල දී යාපනේ පාලකයන්ගෙන් පෘතුගීසීන්ට බාධා එල්ල වීමයි.
(3) යාපනේ සිංහාසනයට උරුමකම් කියූ ඇතැම් ද්‍රවිඩ කුමාරවරුන් පෘතුගීසීන්ට පක්ෂව කටයුතු කිරීමයි.
(4) යාපනය රාජධානියේ කතෝලික ආගම ප්‍රචාරය කිරීමට එරෙහිව එහි පාලකයන්ගෙන් දැඩි විරෝධතා එල්ල වීමයි.

**24.** මධ්‍යතන යුගයේ දී ආසියානු වෙළෙඳ ඒකාධිකාරය හිමි වූයේ,
(1) රෝමවරුන්ට ය. (2) මුස්ලිම්වරුන්ට ය. (3) ඉන්දියානුවන්ට ය. (4) පෘතුගීසීන්ට ය.

**25.** කොන්ස්තන්තිනු ද සා ඇතුළු පෘතුගීසි හමුදාව පරාජයට පත් වූයේ කුමන සටනේදී ද?
(1) දන්තුරේ (2) බලන (3) රන්දෙණිවල (4) ගන්නෝරුව

**26.** කාර්මීකරණය නිසා සමාජීය වශයෙන් සිදු වූ පරිවර්තනයක් වන්නේ,
(1) බහු ජාතික ව්‍යාපාර වර්ධනය වීම ය.
(2) බැංකු සේවා පුළුල් වීම ය.
(3) නාගරීකරණය වේගවත් වීම ය.
(4) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩිදියුණු වීම ය.

**27.** පහත A – E දක්වා ඇති තොරතුරුවලින් කාර්මික විප්ලවය නිසා ඇති වූ **අහිතකර** ප්‍රතිඵල පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

A – මිනිස් ශ්‍රමය වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම
B – පරිසර දූෂණය
C – රැකියා සුලභ වීම
D – ශ්‍රම සූරාකෑම
E – යටිතල පහසුකම් දියුණු වීම

(1) A සහ D (2) B සහ D (3) B සහ E (4) C සහ D

**28.** **I තීරුවෙන්** හා **II තීරුවෙන්** බ්‍රිතාන්‍යයන් මෙරට බලය ලබාගැනීම පිළිබඳ තොරතුරු කිහිපයක් දැක්වේ. **I තීරුවට** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කිව් ලිපිය<br>2. මද්‍රාසි නිලධාරීන් | A – වෙළෙඳ සම්බන්ධතා ඇති කරගැනීමට යොමු වීම<br>B – ලන්දේසි සතු ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට පැවරීම<br>C – මුහුදුබඩ ප්‍රදේශ පරිපාලනය කිරීම |

(1) A සහ B (2) B සහ C (3) C සහ A (4) C සහ B

- බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක ලක්ෂණ පහත දැක්වේ. ඒවා ඇසුරෙන් **29** හා **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම
B – මහජන ඡන්දයෙන් නියෝජිතයින් තෝරාගැනීම
C – ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම
D – රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

**29.** කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D

**30.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

● පහත A, B, C හා D ප්‍රකාශ ඇසුරෙන් **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – සුළු ආරවුල් පිළිබඳ නඩු විසඳීම
B – ගමේ ඇළ වෙළි සකස් කිරීම හා නඩත්තුව
C – කුමන්ත්‍රණ නඩු විසඳීම
D – විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු විසඳීම

**31.** ගම්සභාව සතු බලතල දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ D

**32.** රජු සතු බලතල දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ D

● පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක **33** සිට **35** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. සින්කෝනා වගාව
2. දුල්කඳුර වත්ත

B – 1. බ්‍රිතාන්‍ය පාලනය
2. මධ්‍යම පන්තිය

C – 1. ශ්‍රමයට වැටුප් ගෙවීම
2. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය

D – 1. හෙමලියා වෙස්ටර්ප්‍රික්ස්
2. කෝපි වගාව

**33.** පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න බිහි වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**34.** දෙවැන්න අහෝසි කිරීමත් සමග පළමුවැන්න ආරම්භ වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**35.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් **නොදැක්වෙන** යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**36.** පහත A, B, C හා D වලින් දක්වා ඇති කරුණු අතුරෙන් අමෙරිකානු විප්ලවය හා ප්‍රංශ විප්ලවය යන විප්ලව දෙකට ම හේතු වූ පොදු කරුණක් වන්නේ කුමක් ද?

A – පාලකයන්ගේ සුඛෝපභෝගී ජීවිතය
B – අසාධාරණ බදු පැනවීම
C – දාර්ශනික මතවාදවල බලපෑම
D – වැඩවසම් සමාජ ක්‍රමයේ බලපෑම

(1) A (2) B (3) C (4) D

**37.** කුඩා රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් ඒකාබද්ධ කොට 'ජර්මනිය' නමින් බලවත් රාජ්‍යයක් නිර්මාණය කළ නායකයා වන්නේ,
(1) දෙවන විලියම් (කයිසර්) ය.
(2) වොන් වොල්ක් ය.
(3) ඔටෝ වොන් බිස්මාර්ක් ය.
(4) ඇඩොල්ෆ් හිට්ලර් ය.

**38.** විප්ලවයට පෙර රුසියානුවන්ට උග්‍ර ආහාර හිඟයකට මුහුණදීමට සිදු වූයේ,
(1) ඉඩම්වල අයිතිය රදළයන් සතු වූ නිසා ය.
(2) වැඩවසම් ආර්ථිකය බිඳවැටීම නිසා ය.
(3) ගොවීන් හමුදා සේවයට බඳවාගැනීම නිසා ය.
(4) අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් ගෙවීමට සිදු වූ නිසා ය.

**39.** "මේ අවස්ථාවේ අප බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත" මෙම ප්‍රකාශය කිනම් විප්ලවයක් හා සම්බන්ධ වේ ද?
(1) අමෙරිකානු විප්ලවය
(2) ප්‍රංශ විප්ලවය
(3) රුසියානු විප්ලවය
(4) චීන විප්ලවය

**40.** ලෝක ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින් පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතනය හඳුන්වන කෙටි නම කුමක් ද?
(1) ILO (2) UNESCO (3) WHO (4) UNICEF

* * *



CamScanner

රහස්‍යයි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2024 (2025)

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: **33**   විෂයය / பாடம்: **ඉතිහාසය**

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 1 | 31. | 1 |
| 02. | 1 | 12. | 1 | 22. | 4 | 32. | 4 |
| 03. | 3 | 13. | 2 | 23. | 4 | 33. | 2 |
| 04. | 1 | 14. | 1 | 24. | 2 | 34. | 3 |
| 05. | 4 | 15. | 3 | 25. | 3 | 35. | 1 |
| 06. | 1 | 16. | 2 | 26. | 3 | 36. | 2 |
| 07. | 2 | 17. | 2 | 27. | 2 | 37. | 3 |
| 08. | 3 | 18. | 3 | 28. | 2 | 38. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 2 | 39. | 3 |
| 10. | 1 | 20. | 2 | 30. | 4 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

## 33 - ඉතිහාසය

### II පත්‍රය

### I කොටස

**උපදෙස්:**

* **I කොටසේ** ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
* **II කොටසින්** ප්‍රශ්න **හතරකට** ද, **III කොටසින්** ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

### I කොටස


**1. (අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල** ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

වළවේ ගඟ, මහවැලි ගඟ, හුරුළු වැව, රන්දෙණිගල ජලාශය, මින්නේරිය වැව, මිහිතාගල්කන්ද, මාතොට, මහනුවර, පේදුරුතුඩුව, පුත්තලම, සීතාවක, කොඩ්ඩියාර් කොටුව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල** ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

ජර්මනිය, ලිස්බන්, මලය අර්ධද්වීපය, මදුරාසිය, නාගසාකි, උතුරු මුහුද (ලකුණු 06 යි)


(1). (අ) (i)






අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**(1). (අ) (ii)**



**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - අතීතයේ මැටි බඳුන් සැකසීම සඳහා භාවිත කළ සරල යන්ත්‍රය කුමක් ද?

*B* - අනුරාධපුර රාජධානියේ ප්‍රථම රජතුමා කවුරුන් ද?

*C* - ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලද්දේ කවුරුන් විසින් ද?

*D* - පළමුවන ලෝක යුද සමයේ දී ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමූ මගී නෞකාව කුමක් ද? (ලකුණු 04 යි)

**A.** සකපෝරුව

**B.** පණ්ඩුකාභය

**C.** ජොහැන්ස් ගුටෙන්බර්ග්/ ගුටෙන්බර්ග්

**D.** ලුසිටානියා

***(ලකුණු 1×4 = 4 යි)***

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

2. එය හමුවී ඇති ස්ථානය කුමක් ද?

3. එය භාවිත කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?

4. එය අයත් වූ ප්‍රාග් ඓතිහාසික යුගය කුමක් ද?



*A*

(ලකුණු 04 යි)

*A*

1. මැටි ඔරු සුසාන/ මැටි ඔරුවක්
2. රංචාමඩම
3. අදාහනයට / භස්මාවශේෂ තැන්පත් කිරීමට/ මලසිරුරු පිලිස්සීම/ යාතු කර්ම චාරිත්‍ර පැවැත්වීම / ඇට සැකිලි ආදාහනය
4. පූර්ව ඓතිහාසික යුගය

***(ලකුණු 1×4 = 4 යි)***

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

2. එය පිහිටි නගරය කුමක් ද?

3. මෙම ගොඩනැගිල්ල භාවිත කරන ලද්දේ කුමක් සඳහා ද?

4. එය හා සම්බන්ධ විප්ලවය කුමක් ද?



*B*

(ලකුණු 04 යි)

*B*

1. බැස්ටීල් බන්ධනාගාරය/ බැස්ටීලය / බැස්ටීලයට පහරදීම.
2. පැරිස්/ පැරිසිය
3. සිර කඳවුරක් ලෙස/ සිරකරුවන් රඳවා තැබීමට / රජුට එරෙහි වූවන් හෝ රජතුමාගේ දේශපාලන විරුද්ධවාදීන් සිරකරුවන් ලෙස තැබීමට
4. ප්‍රංශ විප්ලවය

***(ලකුණු 1×4 = 4 යි)***



CamScanner

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

### ප්‍රශ්න අංක 02

ඉගෙනුම් පල:

*ශ්‍රී ලංකාවේ මුල් යුගයේ පාලකයින් පිළිබඳ තොරතුරු විස්තර කරයි.*

> **2.** (i) පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප භාවිත කළ රජවරු *A*, *B* හා *C* යටතේ **අනුපිළිවෙළින්** දක්වන්න.
>
> *A* - දේවත්ව
> *B* - පර්වතරාජ
> *C* - චක්‍රවර්ති (ලකුණු 03 යි)
>
> (ii) අතීතයේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
>
> (iii) පැරණි රජවරුන් විසින් තමාගෙන් රටවැසියාට ඉටුවිය යුතු යැයි සැලකූ යුතුකම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
>
> (iv) පළමුවන විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)**

A. මහසෙන්
B. පළමුවන කාශ්‍යප/ සිගිරි කාශ්‍යප
C. කිර්ති ශ්‍රී නිශ්ශංකමල්ල/ නිශ්ශංකමල්ල

*(ලකුණු 1 × 3 = 03 යි)*

**(ii)**

- පියාගෙන් පුතාට
- සහෝදරයාගෙන් සහෝදරයාට
- රජ බිසවගේ සහෝදරයාට
- රජුගේ සහෝදරියගේ පුත්‍රයාට

*(ලකුණු 2 x 2 = 04 යි)*

**(iii)**

- ආර්ථිකය සංවර්ධනය කිරීම
- රටේ ජනතාවට ආරක්ෂාව සැපයීම
- රටවැසියාගේ ආධ්‍යාත්මික සුවය සැපයීම/ ආගමික කටයුතු
- සමාජ සුභසාධන කටයුතු

*(ලකුණු 2 + 3 = 05 යි)*

**(iv)**

- චෝල පාලනයෙන් රට නිදහස් කර ගැනීම
- බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
- අගනුවර පොළොන්නරුවට ගෙන ඒම
- වාර්ගික සහජීවනයෙන් යුතුව පාලනය කිරීම
- රටේ ආරක්ෂාව සඳහා විදේශ සම්බන්ධතා ඇති කර ගැනීම

*(ලකුණු 3 + 3 = 06 යි)*



CamScanner

## ප්‍රශ්න අංක 03

ඉගෙනුම් පලඃ

*රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන හා සමාජ තොරතුරු විග්‍රහ කරයි.*

| | |
|---|---|
| 3. (i) අතීත ශ්‍රී ලංකාවේ රජවරු සම්බන්ධතා පවත්වා ගත් විදේශ රටවල් **තුනක්** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| (ii) අතීත රජවරු විදේශ සබඳතා පවත්වා ගත් ආකාර **දෙකක්** දක්වන්න. | (ලකුණු 04 යි) |
| (iii) අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ ආගම් පැවති බව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| (iv) අතීත ශ්‍රී ලංකා සමාජයේ විවිධ වෘත්තිකයින් සිටි බව නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

**(i)** ඉන්දියාව (චේර රාජ්‍ය/ කාලිංග/ පල්ලව පාණ්ඩ්‍යදේශය) අරාබිය/ රෝමානු දේශය (රෝමය) චීනය/ කාම්බෝජය/ බුරුමය/ ග්‍රීසිය/ ඇබිසිනියාව (ඉතියෝපියාව)/ පර්සියාව

*(ලකුණු 1 × 3= 03 යි)*

**(ii)**

- වෙළෙඳ සම්බන්ධතා
- ආගමික සම්බන්ධතා (සංස්කෘතික)
- දේශපාලන සම්බන්ධතා
- මිත්‍ර සම්බන්ධතා
- විවාහ සම්බන්ධතා
- තානාපති සම්බන්ධතා

*(ලකුණු 2 × 2= 04 යි)*

**(iii)**

- බුදුදහම ප්‍රධාන ආගම ලෙස පැවැතිම
- හින්දු ආගම පැවැතීම
- ඉස්ලාම් ආගමික අදහස් පැවැතීම

*(ලකුණු 2 + 3= 05යි)*

**(iv)**

- ගුරුවරු
- වෛද්‍යවරු
- නීති විශාරදයින්
- විවිධ ශිල්පීන් (නැට්ටුවන්, සිත්තරුන්, කවියන්) කම්මල් කරුවන්
- විවිධ කාර්මිකයින් (කම්මල්කරු, රන්කරු, කැටයම් ශිල්පීන්, කුම්භකාරවරු)
- වෙළෙඳුන්

*(ලකුණු 3 + 3 = 06යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

## ප්‍රශ්න අංක 04

ඉගෙනුම් පල:

*පාලන මධ්‍යස්ථාන වෙනස්වීමත් සමග එහි ආර්ථිකය හා සංස්කෘතිය වෙනස් වූ ආකාරය විමසා බලයි.*

**4.** (i) පහත සඳහන් රාජධානිවල ආරම්භක පාලකයින් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා ඔවුන්ගේ නම් *A*, *B* හා *C* යටතේ **අනුපිළිවෙළින්** ලියන්න.

*A* - දඹදෙණිය

*B* - කුරුණෑගල

*C* - කෝට්ටේ

(II බුවනෙකබාහු, III විජයබාහු, VI පරාක්‍රමබාහු, III වික්‍රමබාහු) (ලකුණු 03 යි)

(ii) දෙවන නාගරීකරණ අවධියේ රචනා වූ සංදේශ කාව්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ අවධියේ පැවැති වෙළෙඳාමේ ස්වභාවය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ අවධියේ ගෘහනිර්මාණ ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)**

A. III විජයබාහු

B. II බුවනෙකබාහු

C. VI පරාක්‍රමබාහු

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)** මයුර/ තිසර/ හංස/ පරවි/ ගිරා/ සැලළිහිණි /කෝකිල /සැවුල (සීතාවක යුගයේ අලගියවන්න මුකවෙටිතුමා)

*(ලකුණු 1 × 4 = 04යි)*

**(iii)**

- කුරුඳු ප්‍රධාන වෙළෙඳ බෝගයක් බවට පත් වීම
- අපනයන කළ භෝග හා ද්‍රව්‍ය
- ආනයනික ද්‍රව්‍ය
- අභ්‍යන්තර වෙළෙඳාම
- වෙළෙඳ වීදි හා කඩ පැවතීම
- විදේශ වෙළෙඳාමේදී වැදගත් වූ වරායන් පුත්තලම/කල්පිටිය/ගාල්ල
- විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය වීම

*(ලකුණු 2 + 3 = 05යි)*

ඉන්දියාව/ අරාබිය/ පර්සියාව/ රෝමය චීනය.
කුරුණෑගල විස්තරය

**(iv)**

- දකුණු ඉන්දිය ගෘහ නිර්මාණවල ආභාසය ලැබීම
- පාණ්ඩ්‍ය හා කාම්බෝජ ආභාසය
- පිළිමගෙයට සම්බන්ධකර දේවාල ඉදි කිරීම
- ලී කැටයම් ගෘහ නිර්මාණ සඳහා භාවිත කිරීම
- දැවමය වහල නිර්මාණය

තැම්පිට විහාර/ ගෙඩිගෙ සම්ප්‍රදාය.

උදා: හරණය විමනෙක් ලිග කිහිපයක් සම්ප්‍රදාය ලෙස දැක්වේ.

*(ලකුණු 3 + 3= 06 යි)*

## ප්‍රශ්න අංක 05

**ඉගෙනුම් පල:**

*බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථිරවීම හා එහි ක්‍රියාකාරිත්වයේ ස්වරූපය විග්‍රහ කරයි.*

| | | |
|---|---|---|
| **5.** (i) 18 වන සියවසේ යුරෝපයේ ඉහළ ඉල්ලුමක් තිබූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ද්‍රව්‍ය **තුනක්** නම් කරන්න. | | (ලකුණු 03 යි) |
| (ii) බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක **දෙකක්** ලියන්න. | | (ලකුණු 04 යි) |
| (iii) 1818 දී උඩරටියන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව නැගී සිටීමට තුඩුදුන් හේතු **දෙකක්** විස්තර කරන්න. | | (ලකුණු 05 යි) |
| (iv) 1818 නිදහස් අරගලය අසාර්ථක වීමට තුඩුදුන් හේතු **තුනක්** පැහැදිලි කරන්න. | | (ලකුණු 06 යි) |

**(i)** කුරුඳු/ ගම්මිරිස්/ එනසාල්/ කරාබුනැටි/ මුතු/ මැණික්/ ඇත්දළ, සාදික්කා.

*(ලකුණු 1 × 3= 3 යි)*

**(ii)**

- උඩරට ස්වාධීන රාජ්‍යයක් තිබීම ඉංග්‍රීසි පාලනයට තර්ජනයක් ලෙස සැලකීම
- වෙරළබඩ ප්‍රදේශ හා අභ්‍යන්තර දේශ සීමා ආරක්ෂා කිරීමට විශාල වියදමක් දැරීමට සිදු වීම
- මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවන කැරලිවලදී උඩරට රජු කැරලිකරුවන්ට ආධාර දීම
- කොළඹ සිට ත්‍රිකුණාමලය දක්වා උඩරට හරහා ගොඩබිම් මාර්ගයක් ඉදිකිරීමේ අවශ්‍යතාව
- උඩරට රජු ඉංග්‍රීසින්ට විරුද්ධව වෙනත් යුරෝපීය ජාතිකයන්ගේ (ප්‍රංශ) ආධාර ලබා ගැනීම සිදු කරතියි සැකය ඇති වීම
- කඩවත් බදුවලින් නිදහස් වීමට ඉංග්‍රීසින්ට අවශ්‍ය වීම

ජනතාව ආශාවෙන් උඩරට රජු තම රජු ලෙස පිළිගැනීම.

*(ලකුණු 2 × 2 = 4 යි)*



* වෙනත් යුරෝපා ජාතීන්ගේ උදව් ලබා ගැනීම. (ප්‍රංශ)

CamScanner

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**(iii)**

- නිදහස අහිමි වීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳව ගැටලු මතුවීම
- ඌවරට ප්‍රභූ පන්තියට පහර වැදීම
- ඌවරට ප්‍රවාහනය කටයුතු භාර වූ මඩිගේ මොහන්දිරම් තනතුරට මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීම
- ඌවරට ගිවිසුමේ වගන්ති උල්ලංඝනය කිරීම

*(ලකුණු 2 + 3 =05 යි)*

**(iv)**

- ඉංග්‍රීසින් අනුගමනය කළ දැඩි මර්දනකාරී ප්‍රතිපත්ති
- දීර්ඝකාලීන සටනට අවශ්‍ය අවි ආයුධ හා සම්පත් ඌවරැටියන්ට නොතිබීම
- සටනේ අසංවිධානාත්මක ස්වරූපය
- රජු ලෙස ඉදිරිපත් වූ තැනැත්තාට රාජ්‍ය උරුමයක් නැති බව හෙළිවීම
- බ්‍රිතාන්‍යයන්ගේ යුධ ශක්තිය
- ඇතැම් රදළ ප්‍රධානීන් ඉංග්‍රීසින්ට සහය දැක්වීම
- සිංහල නායකයින් අතර මතභේද ඇතිවීම
- මදුරාසියෙන් අතිරේක හමුදා ඉංග්‍රීසින්ට ලැබීම (සිපොයි හට හමුදා)
- දළදාවහන්සේගේ භාරකාරත්වය ඉංග්‍රීසින් සතු කර ගැනීම

බිම්පාළු ප්‍රතිපත්තිය.
මාර්ෂල් යුධ නීතිය.

*(ලකුණු 3 + 3 = 06 යි)*

**<u>ප්‍රශ්න අංක 06</u>**

**ඉගෙනුම් පලඃ**

***විදේශීය බලවේග ශමුවේ ජාතික නායකයින් ක්‍රියාකළ ආකාරය විග්‍රහ කරයි.***

| | | |
|---|---|---|
| **6.** **(i)** | හින්දු ආගමික පුනරුදයේ නායකයින් **තිදෙනෙකු** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| **(ii)** | ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා එහි නායකයින් ගත් ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| **(iii)** | ක්‍රිස්තියානි මිෂනාරිවරුන් ශ්‍රී ලංකාවේ තම ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| **(iv)** | බෞද්ධාගමික පුනරුදය උදෙසා එහි නායකයින් අනුගමනය කරන ලද උපායමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

**(i)**

- ආරුමුග නවලර් තුමා
- පොන්නම්බලම් රාමනාදන්
- පොන්නම්බලම් අරුණාචලම්

*(ලකුණු 1×3 = 03යි)*

**(ii)**

- "මුස්ලිම් නේෂන් " පුවත්පත ආරම්භ කිරීම
- කොළඹ සහිරා විද්‍යාලය ඇතුළු පාසල් පිහිටුවීම
- මුස්ලිම් බාලිකා පාසල් ආරම්භ කිරීම
- ඉංග්‍රීසි හා අරාබි භාෂාවෙන් අධ්‍යාපනය සඳහා උනන්දු කර වීම
- 'මද්රසා' නම් ඉස්ලාම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය කිරීම
- ඉස්ලාම් අධ්‍යාපන සමිති නම් සංවිධානයක් ඇරඹීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- ලේඛණ මාධ්‍ය යොදා ගැනීම
- දේශන මාධ්‍ය යොදා ගැනීම.
- අධ්‍යාපනය යොදා ගැනීම
- විවිධ සමාජ සේවා කටයුතු යොදා ගැනීම

*(ලකුණු 2 +3 = 05යි)*

**(iv)**

- බෞද්ධ පිරිවෙන් පිහිටුවීම
- මුද්‍රණාල පිහිටුවීම හා විවිධ ප්‍රකාශන නිකුත් කිරීම
- සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය බෞද්ධ පාසල් පිහිටුවීම
- ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම
- දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමේ ව්‍යාපාර ආරම්භ කිරීම
- බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ කටයුතු ආරම්භ කිරීම
- අමද්‍යප ව්‍යාපාරය
- ඉරුදින දහම් පාසල් ඇරඹීම, බෞද්ධ කොඩිය නිර්මාණය, වෙසක් පෝය රජයේ නිවාඩු දිනයක් කිරීම ආදී කටයුතු

*(ලකුණු 3 +3 = 06යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

## ප්‍රශ්න අංක 07

ඉගෙනුම් පලඃ

*නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග හා එහි ඵලදායිතාව විග්‍රහ කරයි.*

| | | |
|---|---|---|
| 7. | (i) නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ගොවි ජනපද **තුනක්** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| | (ii) ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු **දෙකක්** ලියන්න. | (ලකුණු 04 යි) |
| | (iii) ගොවි ජනපද පිහිටුවීමේ දී මුහුණදුන් අභියෝග **දෙකක්** විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| | (iv) මහවැලි සංවර්ධන ව්‍යාපාරය බහුකාර්ය යෝජනා ක්‍රමයක් ලෙස සැලකීමට හේතු **තුනක්** පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

**(i)** මින්නේරිය/ කාගම/ නාච්චදූව/ බෙරගම/ මිනිපේ/ පරාක්‍රම සමුද්‍රය/ සංගිලි කනදරාව/ උන්නිච්චායි/ රිදීබැදි ඇල

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)**

- තෙත් කලාපයේ ඉහළ යමින් පවතින ජනගහන තදබදය හා රැකියා හිඟය අඩු කිරීම
- රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
- වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අළුත්වැඩියා කිරීම හා ඉඩම් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම
- තෙත් කලාපයේ පවතින ඉඩම් හිඟය අවම කර ඉඩම් හිමි තෘප්තිමත් ගොවි පරපුරක් නිර්මාණ කිරීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- තෙත් කාලාපයේ ජනතාව තෝරා ගෙන වියළි කාලාපයේ පදිංචි කරවීම
- කලක් වනගතව පැවති බිම් කෘෂි කර්මයට සුදුසු පරිදි සකස් කරවීම හා වාරිමාර්ග පහසුකම් සැලසීම
- ප්‍රථම අස්වැන්න නෙලන තෙක් ජනපද වාසීන්ට ආධාර මුදලක් ලබා දීම
- නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා අලෙවි සංවර්ධන සේවා පිහිටුවීම
- ජනතාවගේ සෞඛ්‍ය අධ්‍යාපනය ඇතුළු පහසුකම් ඇති කිරීම

*(ලකුණු 2 + 3 = 05යි)*

**(iv)**

- එක් අරමුණකට වඩා වැඩි කාර්යයන් රැසක් ඉටු කර ගත හැකි යෝජනා ක්‍රමයක් වීම.
  - ➤ කෘෂි බිම් ප්‍රමාණය වැඩි කර ගත හැකි වීම
  - ➤ ජල විදුලි බල නිෂ්පාදනය සිදු කිරීම
  - ➤ නව ජනාවාස ඇති කිරීම
  - ➤ ආහාර බෝග ව්‍යාප්ත කිරීම
  - ➤ සුලු අපනයන බෝග ව්‍යාප්ත කිරීම
  - ➤ ගංවතුර පාලනය සිදු කිරීම
  - ➤ මිරිදිය මසුන් බෝ කිරීම
  - ➤ විවිධ සේවා හා කර්මාන්ත ආරම්භ කිරීම
  - ➤ නව රැකියා අවස්ථා බිහි කර ගත හැකි වීම

*(ලකුණු 3 + 3 = 06යි)*

නගර බිහි වීම .

# III කොටස

## ප්‍රශ්න අංක 08

ඉගෙනුම් පලඃ

*යුරෝපයේ ඓතිහාසික පසුබිම විමර්ශනය කරයි.*

8. (i) යුරෝපයේ පුනරුද සමයේ විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ තැනැත්තන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත 8 (i) ට අදාළව ඔබ නම් කළ තැනැත්තන් දෙදෙනෙකු ඉදිරිපත් කළ නව මත **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පුනරුද සමයේ කලාශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදයේ ප්‍රතිඵල ලෙස යුරෝපයේ ඇති වූ දේශපාලන හා ආර්ථික වෙනස්වීම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)**

- නිකලස් කොපර්නිකස් / කොපර්නිකස්
- ජොහැන්නස් කෙප්ලර් / කෙප්ලර්
- ගැලිලියෝ ගැලීලි / ගැලීලි
- අයිසැක් නිව්ටන් / නිව්ටන්

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)**

- නිකලස් කොපර්නිකස්
  - පෘතුවිය ගෝලාකාර බව
  - ග්‍රහලෝක සූර්යා වටා පරිභ්‍රමණය වීම
- ජොහැන්නස් කෙප්ලර්
  - ග්‍රහලෝක සූර්යා වටා ඉලිප්සාකාරව ගමන් කිරීම
- ගැලිලියෝ ගැලීලි
  - සඳ මත ආවාට ඇති බව සොයා ගැනීම
  - බ්‍රහස්පති ග්‍රහයාට උපග්‍රහයන් ඇති බව සොයා ගැනීම
- අයිසැක් නිව්ටන්
  - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- ලෞකිකත්වයට හා ස්වභාවිකත්වයට නැඹුරු නිර්මාණ බිහි වීම
- පුද්ගලයාගේ නමින් කලා කෘති එළි දැක්වීම
- කලාකරුවන්ට ස්වාධීනව නිර්මාණ ඉදිරිපත් කිරීමට හැකි වීම
- ආගමික මුහුණුවරින් බැහැර වූ නිර්මාණ බිහි වීම
- චිත්‍ර හා මූර්තිවල නිරුවත් හා අඩනිරුවත් රූප නිර්මාණය වීම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

CamScanner

Past Papers Wiki



- කිරිගරුඩින් ප්‍රතිමා නිර්මාණය කිරීම
- රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාසය ලබා ගැනීම
- සුබෝපභෝගී මන්දිර තැනීම
- ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ රූප නිර්මාණය කිරීම

(ලකුණු 2 + 3 = 05යි)

**(iv)**

<u>දේශපාලන වෙනස්වීම්</u>

දේශපාලන (2)
ආර්ථික (1)
ආර්ථික (1)
දේශපාලන (2)

- ජාතික රාජ්‍ය බිහි වීම
- රජුවටා බලය කේන්ද්‍රගත වීම
- මධ්‍යම පන්තිය බිහි වීම
- වංශාධිපතිවරුන්ගේ බලය අඩු වීම
- මධ්‍යම පන්තිය පාලන කටයුතුවලට සහය වීම

<u>ආර්ථික වෙනස්වීම්</u>

- වැඩවසම් ආර්ථික රටාව බිඳ වැටීම
- වෙළෙඳාමේ දියුණුව
- වෙළෙඳාම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති හා බදු ප්‍රතිපත්ති හඳුන්වාදීම හා ක්‍රියාත්මක කරවීම
- මුදල් භාවිතය පුළුල් වීම
- බැංකු කටයුතු ආරම්භ වීම
- නව වෙළෙඳ මාර්ග ඔස්සේ පෙර අපර දිග සෘජු වෙළෙඳ සම්බන්ධතා ඇති වීම
  (එක් දේශපාලන වෙනස් වීමක් සහ ආර්ථික වෙනස් වීමක් පිළිතුරට ඇතුළත් විය යුතුය.)

(ලකුණු 3 + 3 =06 යි)



CamScanner

## ප්‍රශ්න අංක 09

**ඉගෙනුම් පලඃ**

පළමුවන ලෝක යුද්ධය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

> **9.** (i) පළමුවන ලෝක යුද්ධයේ දී ජයගත් පිලට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
>
> (ii) පළමුවන ලෝක සංග්‍රාමය ඇතිවීමට ජර්මනියේ ක්‍රියාකලාපය හේතු වූ බවට කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)
>
> (iii) පළමුවන ලෝක සංග්‍රාමයෙන් මිත්‍ර පිල ජයගැනීමට මුල් වූ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
>
> (iv) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**(i)** අමෙරිකා එක්සත් ජනපදය / බ්‍රිතාන්‍යය / ප්‍රංශය / ඉතාලිය / රුසියාව / ග්‍රීසිය / සර්බියාව / රුමේනියාව

*(ලකුණු 1 × 3 = 03යි)*

**(ii)**

- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේදී ජර්මනිය හා ප්‍රංශය සතුරන් බවට පත් වීම
- ප්‍රංශය හුදෙකලා කිරීමේ බිස්මාර්ක්ගේ ක්‍රියා කලාපය
- ජර්මන් අධිරාජ්‍යයන් පිහිටුවීම සඳහා දෙවන විලියම් රජු අනුගමනය කළ ක්‍රියා කලාපය
- අවිතරඟය හා ජාතිවාදය වර්ධනය සඳහා ජර්මනියේ ක්‍රියා කලාපය
- කාර්මික දියුණුවත් සමග ජර්මනිය යටත් විජිත ඇති කර ගැනීමේ තරඟයට එකතු වීම

*(ලකුණු 2 × 2 = 04යි)*

**(iii)**

- අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිළට එකතු වීම
- මධ්‍යම බලවතුන්ගේ පිළේ සිටි ඉතාලිය මිත්‍ර පිළට එකතු වීම
- ජර්මනිය තුළ ඇති වූ අර්බුධකාරී තත්ත්වය
- මිත්‍ර පිලේ ප්‍රහාරයන් නිසා ජර්මනියේ යුධ බලය දුර්වල වීම
- ජර්මන් අධිරාජ්‍යයා බලය අත්හැරීම

*(ලකුණු 2 + 3 = 05යි)*

**(iv)**

- අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා නොගැනීම
- රුසියාව ජාතීන්ගේ සංගමයට බඳවා නොගැනීම
- ජාතීන්ගේ සංගමය ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට හමුදා බලයක් නොතිබීම
- සංගමයේ තීරණ ක්‍රියාත්මක කිරීමට සාමාජිකයින් පොළඹවා ගැනීමට අසමත් වීම
- ඇතැම් බලවත් රාජ්‍යයන් ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම
- ලෝක සාමය කඩකළ අවස්ථාවලදී එම රටවලට විරුද්ධව කටයුතු කිරීමට සංගමය අපොහොසත් වීම.

*(ලකුණු 3 + 3 = 06 යි)*

ප්‍රධාන 2ක්
සැකැස්මේ දුර්වලතා
ක්‍රියාකාරිත්වයේ දුර්වලතා

***



CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න